# අපේ ගමේ රබර් කිරේ කතාව



අශ්මි මෙතුසරී බණ්ඩාර



# අපේ ගමේ රබර් කිරේ කතාව

ප්‍රථම එළිදැක්වීම - 15.11.2023
ISBN 978-624-208-080-2

අශ්මි මෙතුසරී බණ්ඩාර

# පිදුම

මෙම පොත
මගේ ගුරු මෑණිවරුන්ට
හා පියවරුන්ට
පුදමු.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග වර්ග 3කි. ඉන් රබර් වලට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. අපි දවසක් අරණායක ගියා අත්තම්මා ඉපදුණ ගම බලන්න.

එතකොට මම දැක්කා අරණායක බොහෝ ගෙවල්වල රබර් කර්මාන්තය කරගෙන යනවා.





රබර් බීජ වලින් රබර් පැල ලබා ගන්නවා. වසර හතක් යනතුරු රබර් ගස් වලින් කිරි කපා ගන්න බෑ.







රබර් ගස් කිරි කැපිය හැකි ලෙස වැඩුණු පසු එම ගසෙහි කැපීමක් යොදා එයට පොල් කටුවක් සවිකර රබර් කිරි එකතු කරනවා.

## රබර් කිරි කපන පිහිය







උදෑසනම රබර් කිරි එකතු කිරීම සිදු කරනවා. පොල්කටුවල එකතු වී ඇති රබර් කිරි බාල්දියකට එකතු කර ගන්නවා.






එකතුකල රබර් කිරි වලට නියමිත ප්‍රමාණයකට ජලය එකතු කරනවා. ඉන්පසු එය සුදු යකඩ දැලක් ආධාරයෙන් පෙරා ගන්නවා.









ඉන් පසු මේ මිශ්‍රණයට නියමිත ප්‍රමාණයට ෆෝමික් අම්ලය එකතු කරනවා. ඉන්පසු ඇලුමිණියම් පටියකින් හොඳින් මිශ්‍ර කරනවා. එහිදී සෑදෙන පෙණ ඇලුමිණියම් පටියෙන් ඉවත් කරනවා.









මෙසේ සෑදු මිශ්‍රණය ඉන්පසු මිදීම සඳහා කුණුරොඩු නොවැටෙන සේ ආවරණය කර තබනවා.





එසේ ලැබෙන කිරි කැටිය ඇලුමිනියම් තහඩුවක රොටියක් සේ සදා ගන්නවා. එය දිය රෝල ආධාරයෙන් අඹරා ගන්නවා.










අඹරාගත් රබර් ෂීට් ගලා යන ජලයෙන් සෝදා ගන්නවා. රබර් ෂීට්වල ජලය ඉවත්වන සේ පවනේ හා හිරු එළියේ වියළා ගන්නවා.







රබර් ෂීට් දුම් ගැසීම සිදු කරන්නේ ඉන් පසුවයි. මේ සඳහා විශේෂයෙන් සැකසු දුම් ගෙය භාවිතා කරනවා. දුම් ගැසු රබර් ෂීට්වල පැහැය වෙනස් වෙනවා. මෙසේ අවසානයේ ලැබෙන රබර් ෂීට් විකිණීම කරනු ලබනවා.






# රබර් කර්මාන්තයේදි යොදාගන්නා උපකරණ



රබර් කපන පිහිය



පොල්කට්ට



බාල්දිය හා තැටිය



ඇලුමිණියම් පෙරණය



ෆෝමික් අම්ලය



ඇලුමිණියම් තහඩුව



දිය රෝල

# රබර් වලින් විවිධ භාණ්ඩ සෑදීම සිදු කරනවා.

රබර් බිම් ඇතිරිලි

මෙට්ට්‍රස්

ඇසුරුම් ද්‍රව්‍ය

රබර් සීල්

රබර් මිශ්‍ර මල් පෝච්චි

සෙල්ලම් බඩු



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**